## සිරකරු සුභසාධක අරමුදල - 2017

-----------------------------------

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තු සිරකරු සුභසාධක අරමුදල් පනතේ 7(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම අරමුදලට අදාලව කළමනාකරණ විගණන වාර්තාව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත 2018 සැප්තැම්බර් 17 දින නිකුත් කරන ලදි. 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තු සිරකරු සුභසාධක අරමුදල් පනතේ 7(2) වගන්තිය ප්‍රකාර බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3. විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන
-------------------

### 2.1. තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට සිරකරු සුභසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------------

#### 2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති
-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07</u>

(i). වත්කමක් හුවමාරු නොවන ගනුදෙනුවක් හරහා අත්පත් කරගෙන ඇති විට, එහි පිරිවැය එම වත්කම අත්පත්කර ගත් දිනට පැවති සාධාරණ වටිනාකමට අගය කල යුතු වුවත් බන්ධනාගාර ආයතන 03 ක පරිත්‍යාග වත්කම් අයිතම 43 ක පිරිවැය මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි.

(ii). වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය නිශ්චය කිරිමේදී වත්කමෙහි අපේක්ෂිත භාවිතය, වත්කමෙහි අපේක්ෂිත ධාරිතාවය සලකමින් තක්සේරු කල යුතු වුවත් අරමුදලේ රු.1,424,252 ක් වූ පරිත්‍යාග වත්කම් සඳහා අපේක්ෂිත භාවිතය සැලකිල්ලට ගෙන නොතිබුණි.

#### 2.2.2. ගිණුම්කරණ ප්‍රතිපත්ති
--------------------------

පරිත්‍යාග ලෙස ලැබෙන වත්කම්වල වටිනාකම ක්‍රමානුකූල පදනමකට වාර්ෂිකව ආදායම් ලෙස හඳුනාගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට පරිත්‍යාග වත්කම්වල ධාරණ අගය රු.9,016,241 ක් වුවද එදිනට පරිත්‍යාග වත්කම් සංචිත ගිණුමේ ශේෂය රු.22,721,280 ක් වී තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී බන්ධනාගාර ආයතන 06 ක් විසින් මිලදී ගෙන තිබූ පිරිවැය රු.77,950 ක් වූ පාරිභෝජ්‍ය භාණ්ඩ හා බන්ධනාගාර ආයතන 09 ක් වෙත පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු.64,650 ක් වූ පාරිභෝජ්‍ය භාණ්ඩ ජංගම නොවන වත්කම් ලෙස සලකා ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් රු.142,600 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) බන්ධනාගාර ආයතන 05 ක් වෙත ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබුණු රු. 91,175 ක්වූ සිරකරු ශ්‍රම ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.58,647 ක සිරකරු ශ්‍රම ආදායම මූල්‍ය ප්‍රකාශන තුළ ගලපා නොතිබුණි.

(ඇ) මැගසින් බන්ධනාගාරයට සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු පිරිවැය රු.70,000 ක් වු පරිත්‍යාග වත්කම් රු.7,000 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් පරිත්‍යාග වත්කම් රු. 63,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ඈ) සිරකරු ශ්‍රමය සැපයීමෙන් ලැබිය යුතු මුදල් 2016 වර්ෂය සඳහා නැවත ප්‍රකාශකල අගය රු.1,028,800 ක් වුවද අදාල ලෙජර් ගිණුමේ 2017 වර්ෂයේ ඉදිරියට ගෙනආ ශේෂය රු.1,036,800 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ජංගම වත්කම් රු.8,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.4 නොසැසඳුන පාලන ගිණුම්**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බන්ධනාගාර ආයතන 04 ක් විසින් සමාලෝචිත වර්ෂයට අදාල ආදායම රු.599,560 ක් ලෙස සනාථ කර තිබුණද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.655,568 ක් වූයෙන් රු. 56,008 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ලැබීම් රු.1,516,647 ක් වුවද ගිණුම් සාරාංශ අනුව ලැබීම් රු.1,602,381 ක් වීමෙන් රු.85,735 ක වෙනසක් නිරීක්ෂණය වු අතර මූල්‍ය ප්‍රකාශන අනුව වියදම රු.2,921,448 ක් වුවද ගිණුම් සාරාංශ අනුව වියදම රු.2,987,839 ක් වීමෙන් රු.66,390 ක වෙනසක් පැවතුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

-----------------------------------

පහත සඳහන් ගනුදෙනු හා ගිණුම් ශේෂයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | **විෂයය** | **වටිනාකම**<br>රු. | **ඉදිරිපත් නොකල සාක්ෂිය** |
|---|---|---|---|
| (අ) | උපචිත සිර ශ්‍රම ආදායම හා අත්තිකාරම් | 9,340 | බන්ධනාගාර ආයතන 02 ක ශේෂ සනාථන |
| (ආ) | පරිත්‍යාග වත්කම් | 2,220,016 | බන්ධනාගාර ආයතන 16 ක සත්‍යාපන වාර්තා |

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

බන්ධනාගාර ආයතන 03 ක අභ්‍යන්තර කැරලි වලින් හානියට පත්වු පරිත්‍යාග වත්කම් හා ගාල්ල බන්ධනාගාරයේ 2004 වර්ෂයේ සුනාමි ව්‍යසනයෙන් විනාශ වු පරිත්‍යාග භාණ්ඩ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1. මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,705,398 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,238,425 ක ඌනතාවයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.533,027 වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අරමුදලේ ආදායම රු.276,953 කින් වැඩිවීම හා සිරකරු සුහසාධන වියදම් රු.214,937 කින් අඩුවීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාවිතය අවසන්, අක්‍රිය හා සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ පිරිවැය රු.1,104,391 ක් වූ පරිත්‍යාග වත්කම් අයිතම 60 ක් පොත්වලින් ඉවත් කිරීමට බන්ධනාගාර ආයතන 11 ක් විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) බෝගම්බර බන්ධනාගාරය දුම්බර බන්ධනාගාරය වෙත විතැන් කිරීමෙන් පසුව පිරිවැය රු.189,315 ක් වටිනා පරිත්‍යාග වත්කම් අයිතම 15 ක් අස්ථානගත වී තිබූ අතර ඒ සඳහා මුදල් රෙගුලාසි 103(1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද කොළඹ බන්ධනාගාරයේ පිරිවැය රු.46,500 ක් වටිනා පරිත්‍යාග වත්කම් අයිතම 05 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 752(4) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ආදායම රු.1,524,250 ක් වූ අතර ආදායම වැඩිකර ගැනීම සඳහා පනත ප්‍රකාරව ඇති ප්‍රතිපාදන උපයෝගී කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. විශේෂයෙන් විනෝද භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ශුද්ධ ආදායමෙන් අරමුදල වෙත ලැබෙන කොටස වැඩිකර ගැනීමට, සිර වේතනවලින් අරමුදල වෙත ලැබෙන කොටස වැඩිකර ගැනීමට, සිර ශ්‍රමය සැපයීමෙන් බාහිර ආයතනවලින් අයකරන මුදල් වැඩිකර ගැනීමට මහජන පරිත්‍යාග වැඩිකර ගැනීමට සහ බන්ධනාගාර තුළ ආපනශාලා පවත්වා ගැනීමට නිසි ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු අතර 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුහසාධක අරමුදල් පනත සංශෝධනය කර ගැනීමට ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

මුදල් රෙගුලාසි 133 හා 134 ප්‍රකාරව සිරකරු සුහසාධක අරමුදලේ කාර්යයන් හා ගණුදෙනු පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර අභ්‍යන්තර විගණන සැලැස්මෙහි ද සිරකරු සුහසාධක අරමුදලේ කාර්යයන් හා ගනුදෙනු විගණනය සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි.

**5.2 අයවැය පාලනය**

-------------------

බන්ධනාගාර ආයතන 09 ක ඇස්තමේන්තුගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 26 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් හා බන්ධනාගාර ආයතන 14 ක ඇස්තමේන්තුගත ලැබීම් හා තත්‍ය ලැබීම් අතර සියයට 32 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

**06. පද්ධති හා පාලනයන්**

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට වරින්වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතුව ඇත.

| | **පාලන ක්ෂේත්‍රය** | **නිරීක්ෂණය** |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති නිසි පරිදි අනුගමනය නොකිරීම හා ගිණුම් පොත්පත් හා ලේඛන නිසි පරිදි නොපැවැත්වීම. |
| (ආ) | වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන, පරිත්‍යාග වත්කම්, සත්‍යාපන වාර්තා හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා අතර වෙනස්කම් පැවතීම, පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ස්ථාවර වත්කම් අගයකර ගිණුම්ගත නොකිරීම හා වත්කම් භෞතික සත්‍යාපනය සිදු නොකිරීම. |